**මුද්දර ලෝකය**

# ලෝක අභ්‍යාවකාශ දිනය

**අනුර සමරවීර**

**ඈත අතීතයේ සිට ම මිනිසා තුළ අභ්‍යාවකාශ තරණය පිළිබඳව විශාල උනන්දුවක් පැවතිණි. කෙසේ නමුදු 1957 ඔක්තෝබර් 4 ද සෝවියට් දේශය විසින් මුල්වරට රොකට්ටුවක් උඩුගුවනට යැවීමත් සමඟ අභ්‍යවකාශ තරණය පිළිබඳව ලෝක වාසීන් ගේ අවධානය යොමු විය.**

ලෝක අභ්‍යාවකාශ දිනය අප්‍රියෙල් 12 දිනට යෙදී තිබේ. 21 වන සියවස ආරම්භයත් සමඟ නව තාක්ෂණික යුගයකට පියමන් කරන අපට සියවස මුල් භාගයේ දී මිනිසකු අඟහරු ලෝකයට යැවීමට විද්‍යාඥයන් දරන උත්සාහය පිළිබඳව ද අසන්නට ලැබේ. විශාල මුදලක් වැයවන අසීරු කටයුත්තක් වන අඟහරු තරණය පිළිබඳ වූ අනාවැකිය තක්සේරු කිරීම සඳහා පසුගිය සියවස තුළ ලැබූ අභ්‍යවකාශ තරණයේ ජයග්‍රහනයන් පෙළ පිළිබඳව ද අමතක කළ නොහැකි ය.

ඈත අතීතයේ සිට ම මිනිසා තුළ අභ්‍යාවකාශ තරණය පිළිබඳව විශාල උනන්දුවක් පැවතිණි. කෙසේ නමුදු 1957 ඔක්තෝබර් 4 ද සෝවියට් දේශය විසින් මුල්වරට රොකට්ටුවක් උඩුගුවනට යැවීමත් සමඟ අභ්‍යවකාශ තරණය පිළිබඳව ලෝක වාසීන් ගේ අවධානය යොමු විය. ස්පුට්නික් I නම් වූ එම චන්ද්‍රිකාව විනාඩි 96 කට වරක් පොළොව වටා කරකැවෙමින් සංඥා එවනු ලැබී ය. මුල්ම චන්ද්‍රිකාව බිහිකිරීම පිටුපස සිටි සෝවියට් මහා මොළය වූයේ 'සර්ජි පාලොවිච් කොරොලොව්' නමැති විද්‍යාඥයා ය. ඔහු 1930 දශකයේ දී අභ්‍යාවකාශ යුගයේ පියා ලෙස සැලකෙන කොන්ස්ටනටින් සියල්කොව්ස්කි සමඟ ද අභ්‍යාවකාශ පරයේෂණවලට සම්බන්ධ වූ පුද්ගලයෙක් විය.

සෝවියට් දේශයේ මෙම වික්‍රමය ඇමරිකා එක්සත් ජනපදයේ විස්මයට හේතු විය. අභ්‍යාවකාශ තරණය පිළිබඳ ඔවුන් ගේ වැඩපිළිවෙල වේගවත් කරන ලද අතර එමගින් අභ්‍යවකාශ තරණ ක්‍රියාවලියට නව පණක් ලැබිණි. මේ අතර සෝවියට් දේශය එම වසරේදීම නොවැම්බර් 2 ද ස්පුනික් 2 චන්ද්‍රිකාව අභ්‍යාවකාශයට යැවී ය. එමඟින් 'ලයිකා' නමැති සුනඛයා ද අභ්‍යාවකාශ ගත විය. ඒ උඩු ගුවනට ගිය ප්‍රථම සත්වයා යි.

මේ වන විට අභ්‍යාවකාශ තරණයේ දී සෝවියට් දේශයට පසුපසින් වූ ඇමරිකා එක්සත් ජනපදය තම නාවික හමුදව ලවා ඔවුන් ගේ ප්‍රථම චන්ද්‍රිකාව 1957 දෙසැම්බර් 6 ද ගුවන්ගත කිරීමට උත්සහ දැරී ය. එහෙත් එය අසාර්ථක විය. පසුව එවකට ඇමරිකා එක්සත් ජනපදයේ විසූ ජර්මානු විද්‍යාඥයකු වූ වර්නන් වොන් බ්‍රවුන් ගේ සහාය ලබා ගනිමින් 1958 ජනවාරි 31 ද එක්ස්ප්ලෝරර්-1 නම් චන්ද්‍රිකාවක් උඩුගුවනට යැවීමට ඔවුනට හැකි විය. මෙම චන්ද්‍රිකාව නිර්මාණය කළේ ආචාර්ය විලියම් පිකරිං ඇතුළු විද්‍යාඥයන් කණ්ඩායමක් විසිනි.

මෙලෙස සෝවියට් දේශයේ හා ඇමරිකා එක්සත් ජනපදයේ අභ්‍යාවකාශ තරණ තරගය ආරම්භ වීම, එම වැඩපිළිවෙලේ දියුණුවට අත්වැලක් විය. 1958 ඔක්තෝබරයේ දී ඇමරිකා එක්සත් ජනපදය ඔවුන් ගේ අභ්‍යාවකාශ තරණ වැඩපිළිවෙල තරදුරටත් නංවනු පිණිස ජාතික ගගන හා අභ්‍යාවකාශ අධිකාරිය (නාසා ආයතනය) පිහිටුවීමට හේතු වූයේ ද එම තත්ත්වයම ය.

ඔවුන් ගේ ප්‍රධාන අරමුණ වූයේ මිනිසකු උඩුගුවනට යැවීමයි. 1959 දී එක් මිනිසකු උඩුගුවනට යැවිය හැකි 'මර්කරි' යානය නිපදවීමට ඔවුනට හැකි විය. මේ කාලයේ දී රුසියාවේ ඉලක්කය වූයේ සඳ වෙත රොකට්ටුවක් යැවීමයි. කෙසේ නමුත් සඳ වෙත රොකට්ටුවක් යැවීමේ මුල්ම උත්සහය ක්‍රියාත්මක කළේ ඇමරිකා එක්සත් ජනපදය යි. එහෙත් 1958 අගෝස්තු 17 ද ගුවන් ගත කළ ඔවුන් ගේ 'ඒබර් 1' හි ගමන අසාර්ථක එකක් විය.

සෝවියට් දේශයෙන් 1959 ජනවාරි 2 දින යැවුණු ලූනික් - 1 යානයට, ඊට දින දෙකකට පසුව සඳට සැතපුම් 4660 ක් ආසන්නයට යාමට හැකි විය. එය පොළොවේ ආකර්ෂණයෙන් මිදී ගිය මුල්ම යානය යි. ලූනික්-2 යානය සඳ මත පතිත වූ අතර ලූනික්-4 යානය සඳේ අඳුරු පස ඡායාරූපය පොළොවට එවීමට සමත් විය.

1960 වන විට මිනිසකු උඩුගුවනට යැවීමට සෝවියට් දේශයේ හා ඇමරිකා එක්සත් ජනපදයේ ද උත්සහයක් පැවතිණි. සෝවියට් දේශයේ වොස්ටොක් යානයෙන් 1961 අප්‍රියෙල් 12 දින යූරි ගගාරින් නම් අභ්‍යාවකාශ ගාමියා උඩුගුවනට ගියේ එම වික්‍රමය කළ මුල්ම මිනිසා වීමේ ගෞරවය ද හිමි කර ගනිමිනි. ලෝක අභ්‍යාවකාශ දිනය ලෙස අප්‍රියෙල් 12 දින නම් කරන ලද්දේ මේ කරුණ හේතුවෙනි.

1965 මාර්තු 18 දින ගුවන්ගත කළ වොෂ්කෝඩ්-2 යානයෙන් උඩුගුවනට ගිය අභ්‍යාවකාශ ගාමියකු වූ ඇලෙක්සි ලියනොව් උඩුගුවනේ මුල් වරට ඇවිදීමෙන් වාර්තාවක් තැබීමට සමත් විය.

මේ අතර 1965 ජූලි 14 ද ඇමරිකා එක්සත් ජනපදයෙන් තවත් වික්‍රමයක් සිදු විය. ඒ 'මැරිනර්' යානය මගින් අඟහරු ගේ ඡායාරූප ලබා ගැනීමයි. එසේම 1965 නොවැම්බර් 16 ද සෝවියට් දේශයෙන් සිකුරු තරුව වෙත රොකට්ටුවක් යවනු ලැබී ය. වීනස් 3 නම් වූ එය පසුව ඉලක්කයටම ළඟා වීමට සමත් විය.

1966 අවසාන කාලය වනවිට මිනිසුන් රහිත යානා සඳවෙත යැවීමට සෝවියට් දේශය හා ඇමරිකා එක්සත් ජනපදය යන දෙරට ම සමත් විය. ඇපලෝ වැඩපිළිවෙල යටතේ මිනිසුන් සහිත වූ යානයක් ලෙස උඩුගුවනට ගියේ ඇපලෝ-7 යානයයි. ඇපලෝ - 8 යානය මිනිසා සඳ සමීපයට ගෙන යාමට සමත් විය. ඇපලෝ 9 හා 10 යානා ලූනා යානාවක් සමඟ පරයේෂණ ගමන්වල යෙදුණි.

පසුව 1968 ජූලි 18 ද නීල් ආම්ස්ට්‍රෝං, එඩ්වින් ඕල්ඩ්‍රින යන ගගනගාමීන් සඳමත පා තැබීම සඳහා ගගනගාමී මයිකල් කොලින්ස් සමඟ උඩුගුවනට ගියේ ඇපලෝ II යානාවෙනි. ඔවුන් දෙදෙනා සඳමත පා තැබුවේ 1968 ජූලි 20 වන දින දී ය. 1975 වසරේ දී ඇමරිකානු ඇපලෝ යානයක් හා සෝවියට් සෝයුස් අභ්‍යාවකාශ යානාවක් උඩුගුවනේ දී යා කිරීම දෙරටේ අභ්‍යාවකාශ වැඩපිළිවෙලෙහි ඒකාබද්ධ ප්‍රයත්නයක් විය. දින දෙකක පරයේෂණවලින් පසු නැවත එම යානා වෙන් වෙන්ව පොළොවට ළඟාවීමට සමත් විය. මේ අතර 1976 වසරේ දී අඟහරු වෙත ළඟා වූ 'වයිකිං I' හා වයිකිං 2' යානා අඟහරු ග්‍රහයා ගේ ඡායාරූප රැසක් ලබා දීමට සමත් වීම ද අභ්‍යාවකාශතරණ වැඩපිළිවෙල ලැබූ ජයග්‍රහණයක් විය. මිනිසුන් සඳට යැවීමේ ඇපලෝ වැඩසටහන ඇමරිකානුවන් විසින් නවතා දැමීමෙන් පසුව ලෝක අවධානය වැඩි වශයෙන් ම යොමු වූයේ අඟහරු ග්‍රහයා වෙත ය.

අඟහරු ග්‍රහයා වෙත මිනිසකු යැවීමට විද්‍යාඥයන් තුළ කැමැත්තක් තිබුන ද එය එතරම් පහසු කටයුත්තක් නොවේ. එබැවින් මිනිසුන් රහිත යානා මගින් අඟහරු පිළිබඳව සොයා බැලීමට ඇමරිකානු විද්‍යාඥයෝ සෑහෙන කලක සිටම පරයේෂණ කරමින් සිටිති. එහි මුල් අඩියර ලෙස 'මාස් ග්ලෝබල් සර්වෙයර්' නම් යානයක් 1996 නොවැම්බර් 6 ද ඇමරිකාවෙන් අඟහරු ග්‍රහයා වෙත යවනු ලැබිණි.

රුසියාව ද 'මාස් 96' නම් අභ්‍යාවකාශ යානය 1996 නොවැම්බර් 16 ද අඟහරු වෙත යවන ලද අතර එය මාස 10 කට පමණ පසු අඟහරු වෙත ළඟා විය. මේ අතර 1996 දෙසැම්බර් 2 ද අභ්‍යාවකාශ ගත වූ ඇමරිකානු 'පාත්ෆයින්ඩර්' යානය 1997 ජූලි 4 දින අඟහරු වෙත ළඟාවූයේ ඊට කලින් යැවූ යානා දෙක අභිබවමිනි. එය ඇමරිකා එක්සත් ජනපදය, අභ්‍යාවකාශ තරණයේ දී ලැබූ සුවිශේෂ ජයග්‍රහණයක් ලෙස සැලකේ. එමගින් රැගෙන ගිය 'සෝජර්නර්' නම් රොබෝවරයට අඟහරු මතුපිට පස් සාම්පල ලබා ගැනීමට මෙන් ම ඡායාරූපගත කිරීම් සඳහා ද හැකියාව සපයා තිබිණි.

මේ ආකාරයෙන් ලබා ගන්නා දත්ත විමර්ශනය කර 21 වන සියවස මුල් භාගයේ දී අඟහරු තරණය කිරීමට සැලසුම් කිරීම සඳහා අභ්‍යාවකාශ විද්‍යාඥයෝ නිරතුරුව ම වෙහෙසෙති. ජාත්‍යන්තර අභ්‍යාවකාශ දිනයේ දී මේ අතීත අත්දැකීම් මෙන්ම අනාගත බලාපොරොත්තු සිහිපත් කළ යුත්තේ එබැවිනි. ලෝක අභ්‍යවකාශ වැඩපිළිවෙලෙහි වැදගත් සිදුවීම් රැසක් මුද්දර මගින් ද නිරූපනය වී තිබේ. ඒවා අභ්‍යාවකාශ තරණයේ ජීවිත කතාව අපට කියාපාන සිහිවටන පෙළක් වැනි ය. ❑

# සියවසක සිහිවටන

## 1975

### ජෝස්

නිවාඩු නිකේතනයක් අසලදී කිමිදුම්කරුවන් රැසකට පහර දෙන මිනිමරු මෝරකු වටා ගෙතුණු චිත්‍රපටියක් වූ ජෝස් නිකුත් වූයේ 1975 දී ය. 'ජෝස්' ස්ටීවන් ස්පිල්බර්ග් ගේ අධ්‍යක්ෂණයක් වූ අතර විශාල ප්‍රේක්ෂක ප්‍රතිචාරයක් දිනාගැනීමට සමත් විය.



ජෝස්

### ෆ්‍රැන්කෝගේ මරණය

ස්පාඤ්ඤයේ ඒකාධිපති පාලක ෆ්‍රැන්කෝ 1976 දී මියගිය අතර නව පාලකයා ලෙස දෙවන ජුවාන් කාලෝස් රජු පත්විය. ෆ්‍රැන්කෝ 1939 සිට 1976 දක්වා ස්පාඤ්ඤය පාලනය කළේ ය. කාලෝස් රජු 1977 දී ප්‍රජාතන්ත්‍රවාදී ඡන්ද ක්‍රමයකට රට මෙහෙය විය.

### ද්‍රව ස්ඵටික



ද්‍රව ස්ඵටික තාක්ෂණයේ විශාල දියුණුවක් 1975 දී ඇති විය. ද්‍රව ස්ඵටික අණු සංඛ්‍යාක ප්‍රදර්ශක සඳහා භාවිත වන්නට වූ අතර පසුව මේවා සාක්කු කැල්කියුලේටර සඳහා භාවිත වන්නට විය.

### වීඩියෝ රෙකෝඩර

වීඩියෝ පටිගත කිරීමේ යන්ත්‍රය පළමුවෙන් ම හඳුන්වා දුන්නේ 1956 දී ය. එහි ප්‍රමාණය පියානෝවක ප්‍රමාණයට සමාන විය. 1975 දී කුඩා ප්‍රමාණයේ පටිගත කිරීමේ යන්ත්‍ර බිහිවූ අතර එය රූපවාහිනිය අසල තබා (යට) සම්බන්ධ කොට භාවිත කරන්නට හැකි විය.

### අභ්‍යාවකාශ සම්බන්ධය

සෝවියට් දේශය හා ඇමරිකාව ප්‍රථම වරට සමීප සබඳතාවක් ඇති අභ්‍යාවකාශ වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කළේ 1975 දී ය. ඇමරිකානු ඇපලෝ 18 හා සෝවියට් සෝයුස් 19 එක්ව පෘථිවිය වටා කක්ෂගත වූ අතර ඉන් වැදගත් ප්‍රතිඵලයක් ලැබිණි. තනි රටක් මෙවැනි වැඩසටහනක් ක්‍රියාත්මක කරනවාට වඩා දෙරටක් එක්ව මෙවැනි දෙයක් කිරීම ප්‍රතිඵලදායී බව පෙනිණි.

## 1976

### ලෙබනන්

ලෙබනනයේ සිවිල් යුද්ධය 1975 - 76 කාලයේ දී ඇතිවූ අතර ඊට හේතු වූයේ මුස්ලිම් පලස්තීන ජාතිකයන් පිටුවහලුන් හා ක්‍රිස්තියානින් අතර ගැටුම් ය. බේරූට් අගනුවර සම්පූර්ණයෙන් ම විනාශ වූ අතර සාමය ඇති කිරීම සඳහා සිරියාවට මැදිහත් වන්නට සිදු විය.

### ඇබා

ස්වීඩන පොප් ගායක කණ්ඩායමක් වූ ඇබා විසින් 1974 දී යුරෝවිෂන් ගී සම්මානය දිනාගන්නා ලදී. 1976 දී ඔවුන් ගේ කණ්ඩායම යුරෝපය තුළ ඉහළම ගී තැටි අලෙවි වාර්තාව පිහිටුවීමට සමත් විය.

### සොවෙතො

1976 ජූනි මස අෆ්රිකානුස් භාෂාව දකුණු අප්‍රිකාවේ පාසල්හි අනිවාර්ය කිරීමට එරෙහිව ජොහැන්ස්බර්ග් හි සොවෙතො නගරයේ සිසුන් කැරැල්ලක් මෙහෙයවූ අතර පොලිස් ප්‍රහාර නිසා 300 කට අධික පිරිසක් මිය ගියහ.

### කොන්කෝඩ්

ඇංග්ලෝ ප්‍රංශ සුපර්සොනික් යානයක් වූ "කොන්කෝඩ්" සිය පළමු ගමන ඇරඹුවේ 1969 දී ය. එහෙත් එය ට්‍රාන්ස් අත්ලාන්තික් සේවාවට පිවිසියේ 1976 දී ය. අද වානිජ ගුවන් සේවා අතරෙන් සාමාන්‍ය සේවාවල යෙදෙන එකම යානය කොන්කෝඩ් ය.



කොන්කෝඩ්

## 1977

### යුරේනස්ගේ වළලු

1977 දී විද්‍යාඥයෝ පිරිසක් සෙනසුරුට සමාන වළලු සමූහයක් යුරේනස් වෙතින් ද දැකගත්හ. වළලු 11 ක් තිබිණි. ඒවා පළලින් කිලෝමීටර 10 ක් පමණ විය.





### පැරිසියට ගැලරියක්

හිටපු ප්‍රංශ ජනාධිපතිවරයකු වූ ජෝර්ජ් පොම්පිඩොගේ නමින් නම් කළ පොම්පිඩෝ ගැලරිය 1977 දී පැරිස් නුවරදී විවෘත විය. එය සැලසුම් කළේ රිචර්ඩ් රොජර්ස් හා රෙන්සෝ පියානෝ ය.

# 1977

## පංකි

බ්‍රිතාන්‍ය යෞවනයන් කණ්ඩායම් නව මෝස්තර අනුගමනය කරමින් අපූර්ව ජීවන පිළිවෙතකට හුරුවූ අතර ඔවුන් හඳුන්වන්නට වූවේ පංකි යනුවෙනි. දිගට උල් හැඩයට වැවූ කෙස්, කන් විද දැමූ ආබරණ, අමුතු ඇඳුම් වැනිදේ ඔවුනට ලාක්ෂණික විය. සාම්ප්‍රදායික බ්‍රිතාන්‍ය ජාතිකයන් එලිසබෙත් රැජිනගේ රාජප්‍රාප්තියේ රිදී ජුබිලිය සමරද්දී ඔවුහු සම්ප්‍රදායික අගයන්, වටිනාකම් ප්‍රතික්ෂේප කළහ.




පංකි

## ස්ටීව් බිකෝ

ස්ටීව් බිකෝ දකුණු අප්‍රිකානු කළු ජාතික නිදහස් ව්‍යාපාරයේ නායකයෙකි. 1977 අගෝස්තු මස ඔහු අත් අඩංගුවට ගනු ලැබිණි. ඔහු පොලිස් අත් අඩංගුවේදී ම මිය ගියේ ය. එහෙත් පොලීසිය සාක්ෂි අතුරුදහන් කළ අතර ඔහු ගේ මරණයේ වගකීම කිසිවකු විසින් බාර නොගන්නා ලදී.

# 1979

## ඒලියන්

රිඩ්ලි ස්කොට්ගේ "ඒලියන්" චිත්‍රපටිය නිකුත් වූවේ 1979 දී ය. එහි කතාවෙන් කියවුණේ පිටසක්වල ජීවියකු විසින් නොස්ට්‍රොමෝ නම් අභ්‍යාවකාශයානයට පහර දෙන ආකාරය යි.

## ඇපොකැලිප්ස් නව්

ෆ්‍රැන්සිස් ෆෝඩ්ගේ "ඇපොකැලිප්ස් නව්" චිත්‍රපටිය 1979 දී නිකුත් විය. මාලන් බ්‍රැන්ඩෝ රඟපෑ මේ චිත්‍රපටියේ කියැවුණේ යුද්ධයේ අඳුරු පැත්ත ගැන ය.

## ඉරාන විප්ලවය

ඉරාන මූලධර්මවාදීහු ෂා රජු බලයෙන් පහකළ අතර (1979 ජනවාරි 16) ඉරානයේ නායකත්වයට පත් අයතුල්ලා කොමෙනි ෂා රජු රටින් පිටුවහල් කළේ ය. කොමෙනි ඇමරිකාව හා පැවති සියළු සබඳතා බිඳ හෙළීමට කටයුතු යෙදී ය. මේ විප්ලවය මුළුමහත් මැදපෙරදිගම දේශපාලනය උඩු යටිකුරු කළේ ය.



# 1978

## ඩිස්කෝ

රොක් හා පොප් සංගීත මුහුවක් ලෙස ඩිස්කෝ නැටුම් බිහිවූ අතර 1978 දී එය බොහෙවින් ජනප්‍රිය තත්ත්වයකට පත් විය. සැටඩේ නයිට් ෆිවර් චිත්‍රපටියට (ජෝන් ටුවොල්ටා) ස්ටාලින් එලිව් වැනි ගී ඇතුළත් වූ අතර ඩිස්කෝ නැටුම් රැසක් ද එහි විය. එය බෙහෙවින් ජනප්‍රිය වූ චිත්‍රපටියකි.

## වියට්නාම් යුද්ධ චිත්‍රපට

ඇමරිකාව වියට්නාමයෙන් ගොස් වසර 5 කට පසු හොලිවුඩ් සිනමාවේදීහු වියට්නාම් යුද්ධය සිනමාවට නැගූහ.

කමින් හෝම් හා ඩිය හන්ටර් ඊට නිදසුන් ය.

## පෞද්ගලික පරිගණක

ලොව පළමු පෞද්ගලික පරිගණකය වූ අල්ටයාර් 8800 වසර 1975 දී වෙළෙඳපොළට නිකුත් විය. එහෙත් පෞද්ගලික පරිගණක ලොව පුරා වේගයෙන් ව්‍යාප්ත වන්නට වූයේ 1978 දී ය. මේ පරිගණක විප්ලවයට මුල් වූවේ ඇපල් හා වෙනත් පරිගණක සමාගම් ය.




පෞද්ගලික පරිගණක

# 1980

## බිජොන් බොග්

බ්ජොන් බොග් නම් ස්වීඩන ටෙනිස් ක්‍රීඩකයා ටෙනිස් ඉතිහාසය වෙනස් කරමින් 1980 දී විම්බෙල්ඩන් ශූරතාව පස්වෙනි වතාවටත් දිනා ගත්තේ ය. පසුව මාටිනා නවරතිලොවා කාන්තා ශූරතාව 6 වරක් දිනාගනිමින් 1982–87 දී මේ වාර්තාවද බිඳ හෙළුවා ය.



බ්ජොන් බොග්